කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

# බටහිර සම්භාව්‍ය සංස්කෘතිය

## ග්‍රීක හා රෝම නාට්‍ය WCCU – E2015

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ඊස්කිලස්ගේ ඇගමෙම්නොන් හි පළිගැනීම (revenge) සහ දෛවය (fate) යන තේමාවන්ගේ නාට්‍යානුරූපී නිරූපණය විමසන්න.

02. සොෆොක්ලීස්ගේ කිං ඊඩිපස් හි ඊඩිපස්ගේ සත්‍ය ගවේෂණයේ විනාශකාරී ස්වභාවය සාකච්ඡා කරන්න.

03. යුරිපිඩීස්ගේ හිපොලිටස් නාට්‍යය වේදිකාව මත දේව පළිගැනීම (divine vengeance) නිරූපණය කිරීමක් ලෙස සාකච්ඡා කරන්න.

04. ඇරිස්ටොෆනීස්ගේ ලයිසිස්ට්‍රාටා හි යුද්ධය නිමාකිරීමේ බලවත් අවශ්‍යතාවය කෙරෙහි හාස්‍යජනක උපක්‍රමවල (comic devices) බලපෑම කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

05. ද බැඩ් ටෙම්පර්ඩ් මෑන් හි මානුෂික සබඳතාවන්ගේ වැදගත්කම උපදවීම කෙරෙහි මිනැන්ඩර්ගේ නාට්‍යමය උපක්‍රම (dramatic devices) භාවිතය අගයන්න.

06. ප්ලේටොස්ගේ ද පොට් ඔෆ් ගෝල්ඩ් හි චරිත නිරූපණය කොතරම් විනෝදජනකද? සාකච්ඡා කරන්න.

07. ද මදර් ඉන් ලෝ හි ටෙරන්ස් විවාහය තුළ දෙමව්පියන්ගේ භූමිකාව කෙසේ අවධාරණය කරයිද? විමසන්න.

08. පහත සඳහන් මාතෘකාවන්ගෙන් දෙකකට (02) කෙටි සටහන් සපයන්න.

1. ඩයොනීසස්
2. කැසැන්ඩ්‍රා
3. ආටෙමිස්
4. රෝම රංගභූමිය (Roman theatre)
5. රෝම වස්ත්‍රාභරණ (Roman costumes)

****************************